# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි: 01/2020

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2020.03.05

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>විශ්වවිද්‍යාලවලට අයත් භූමි තුළ පිහිටා ඇති ආයතන</u>**

විශ්වවිද්‍යාලවලට අනුබද්ධ ආයතන විසින් එම විශ්වවිද්‍යාලවලට අයත් ඉඩම්වල ගොඩනැගිලි පිහිටුවා ඇති අතර එම ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාල විසින් අදාළ ආයතන වෙත ලබා දී නොමැති බව විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව, මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන පාර්ශවකරුවන් වෙත වඩා හොඳ අවබෝධයක් ලබාදීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් තොරතුරු නිසි ලෙස අනාවරණය කිරීම විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් කළ යුතු බව කොමිෂන් සභාව 2019 ජූලි මස 11 වන දින පැවති සිය 1013 වන සභාවාරයේ දී තීරණය කරන ලදී.

විශ්වවිද්‍යාලය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ පහත සඳහන් තොරතුරු අනාවරණය කළ යුතුය:

**අනුබද්ධ ආයතන විසින් භාවිතා කරනු ලබන ඉඩම්**: ආයතනවල නම සහ ලිපිනය, වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය සහ පාලක සභා අනුමැතිය පිළිබඳ තොරතුරු

ආයතනය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ පහත සඳහන් තොරතුරු අනාවරණය කළ යුතුය:

**විශ්වවිද්‍යාලය විසින් ආයතන සඳහා වෙන් කරන ලද ඉඩම**: විශ්වවිද්‍යාලයේ නම සහ ලිපිනය, වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය සහ පාලක සභාවේ හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය පිළිබඳ තොරතුරු

කරුණාකර ඒ අනුව අවශ්‍ය කටයුතු කරන්න.

අ කලේ: ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග
සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. ගණකාධිකාරී /විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
11. විශ්වවිද්‍යාල / මණ්ඩප / ආයතනවල පුස්තකාලයාධිපතිවරුන් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් /සහකාර ලේඛකාධිකාරීවරුන්
13. මණ්ඩප /ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
14. විශ්වවිද්‍යාලවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරු/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
15. විගණකාධිපති
16. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
17. වෘත්තීය සමිති ලේකම්වරුන්

ලිපි ගොනු අංක: යූජීසී/ සීඅයිඒ/ එෆ්/ අයිඒ චක්‍රලේඛ./1